# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1902/55 - 2015 පෙබරවාරි මස 20 වැනි සිකුරාදා - 2015.02.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

නියෝග අංක - 31

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

20(5) වැනි වගන්තිය යටතේ නියෝගය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 20(5) වැනි වගන්තිය යටතේ ක්‍රියා කරමින් කිසිම නිෂ්පාදකයෙකු, ආනයනකරුවකු, අසුරන්නකු, බෙදාහරින්නෙකු හෝ වෙළෙන්දෙකු විසින් පහත උපලේඛනයෙහි සඳහන් කර ඇති භාණ්ඩ එහි දක්වා ඇති උපරිම සිල්ලර මිලට වඩා වැඩියෙන් වෙළෙඳාම් කිරීම, වෙළෙඳාම් කිරීම සඳහා ඉදිරිපත් කිරීම, වෙළෙඳාම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු බවට මෙයින් නියම කරනු ලැබේ.

| *නිෂ්පාදනය* | *උපරිම සිල්ලර මිල (රු. ශත)* |
|---|---|
| සුදු සීනි (බහාලුම් රහිත) | කි. ග්‍රෑ. 1 රු. 87.00 |
| සම්පූර්ණ යොදය සහිත කිරිපිටි | ග්‍රෑම් 400 අසුරණය රු. 325.00<br>කි. ග්‍රෑ. 1 අසුරණය රු. 810.00 |
| සස්ටජන් | ග්‍රෑම් 400 අසුරණය රු. 1,500.00 |
| තිරිඟු පිටි (බහාලුම් රහිත) | කි. ග්‍රෑ. 1 රු. 87.00 |
| මුං ඇට | කි. ග්‍රෑ. 1 රු. 265.00 |
| වියළි හාල්මැස්සන් (ආනයනික) | කි. ග්‍රෑ. 1 රු. 385.00 |
| ටින් කළ මාළු | ග්‍රෑම් 425ක ශුද්ධ බර රු. 140.00<br>ග්‍රෑම් 280ක දියර රහිත බර |
| | ග්‍රෑම් 155ක ශුද්ධ බර රු. 70.00<br>ග්‍රෑම් 105ක දියර රහිත බර |
| කොත්තමල්ලි ඇට - කුඩු නොකළ හෝ නොඇඹරූ | කි. ග්‍රෑ. 1 රු. 350.00 |
| උළුදු | කි. ග්‍රෑ. 1ක් රු. 300.00 |
| උම්බලකඩ | කි. ග්‍රෑ. 1ක් රු. 1,740.00 |
| කහ - කුඩු කළ හෝ ඇඹරූ | කි. ග්‍රෑ. 1ක් රු. 800.00 |
| වියළි මිරිස් - කුඩු කළ හෝ ඇඹරූ | කි. ග්‍රෑ. 1ක් රු. 400.00 |

මෙම නියෝගය 2015 පෙබරවාරි මස 20 වැනි දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

රූමි මර්සූක්,
සභාපති.

2015 පෙබරවාරි මස 20 වැනි දින,
කොළඹ දී ය.

03-214

1A - PG 2375 — 205 (2015/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*